# කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය -2012

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

වර්ෂය තුළ විශේෂ පරිත්‍යාග ලෙස 21 වන සියවසට උසස් අධ්‍යාපන ව්‍යාපෘති (HETC) අරමුදලින් රු.719,557 ක් වටිනා පොත් 999 ක් පුස්තකාලයට පරිත්‍යාග කර තිබුණ ද එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

#### 1.2.2 නොසැසඳූ පාලන ගිණුම්

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) උපලේඛන අනුව, යන්ත්‍ර උපකරණ වල අත්පත්කර ගැනිම්වල වටිනාකම වූ රු.865,890 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.73,748,992 ක් වූ ගොඩනැගිලි අත්පත්කර ගැනිම්වල වටිනාකම සඳහා උපලේඛණ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ආපදා ණය, වාහන ණය ,පරිගණක ණය හා අනෙකුත් සේවක ණයවලට අදාලව ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන ණය ලේඛනය හා පොදු ලෙජරයේ වර්ෂයේ ආරම්භක හා අවසාන ශේෂවල පහත පරිදි වෙනස්කම් තිබුණි.

| විස්තරය | පොදු ලෙජරය අනුව ශේෂය | | ණය ලේඛණය අනුව ශේෂය | | වෙනස | |
|---|---|---|---|---|---|---|
| | ආරම්භක | අවසාන | ආරම්භක | අවසාන | ආරම්භක | අවසාන |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වාහන ණය | 35,667 | 1,277,714 | 1,763,115 | 1,458,048 | 1,727,448 | 180,334 |
| පරිගණක ණය | 1,129,500 | 1,240,000 | 1,063,500 | 1,228,000 | 66,000 | 12,000 |
| ආපදා ණය | 15,754,317 | 16,094,073 | 14,365,870 | 15,916,952 | 1,388,447 | 177,121 |
| විශේෂ ආපදා ණය | 392,572 | 103,020 | 392,572 | 980,252 | - | 877,232 |
| සේවක ණය | 282,880 | 9,650 | 293,590 | 341,150 | 10,710 | 331,500 |

### 1.2.3 ගෙවිය යුතු ගිණුම්

2012 දෙසැම්බර් 31 දින වන විට රඳවා ගැනීම් රු.5,281,364 ක් ද , විවිධ ඇප තැන්පත් රු.175,250 ක් හා නොගෙවූ වව්චර් තැන්පත් රු.22,450 ක්ද වශයෙන් එකතුව රු.5,479,064 ක් වූ බැරකම් වර්ෂ 1 සිට වර්ෂ 5 ක් දක්වා වූ කාල පරාසයක සිට පැවත එන නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ශේෂ නිරවල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

2012 දෙසැම්බර් 31 දිනට කෙරිගෙන යන ඉදිකිරීම් කර්මාන්ත ලෙස රු.66,439,561 ක් ශේෂපත්‍රයේ දැක්වෙන අතර,එකිනෙක කොන්ත්‍රාත් වල කෙරිගෙන යන වැඩ වටිනාකම එහි ආරම්භක ශේෂය හා ප්‍රාග්ධනගත කිරීම් පැහැදිලිව හඳුනාගත හැකි පරිදි ලෙජර් ගිණුම් හෝ උපලේඛන සකස් කර නොතිබුණි.

### 1.2.5 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාස ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි 104(2) | 2011 අගෝස්තු 12 දින අනතුරට ලක්ව තිබූ වාහනයක් සම්බන්ධව මූලික පරීක්ෂණ වාර්තා විගණකාධිපතිට එවා නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ගාස්තු අයකරන පාඨමාලා 05 ක සංවිධානය කිරීම වෙනුවෙන් අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයට අනුමැතියකින් තොරව සාමාන්‍ය රාජකාරි වේලාව තුළදී හා සති අන්ත රාජකාරි සඳහා රු.8,787,108 ක් විවිධ දීමනාවන් හා ගාස්තු වශයෙන් ගෙවා තිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) 2011 අප්‍රේල් 07 දිනැති අංක 45 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | 2012 වර්ෂයේ පර්යේෂණ දීමනා වශයෙන් නිලධාරීන් 30 දෙනෙකුට රු. 3,914,230 ක් වියදම් කර තිබූ අතර නිලධාරීන් 18 ෙ දනෙකු පමණක් නියමිත පරිදි වාර්තා ඉදිරිපත් කර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විද්‍යාතනයේ වැඩකටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.133,083,665 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.120,634,006 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.127,600,000 ක ප්‍රදාන හේතුවෙන් ඌනතාවය රු.5,483,665 ක් දක්වා අඩුවී තිබූ අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 111,099,108 ක ප්‍රදානය හේතුකොට ගෙන එම වර්ෂයේ ඌනතාවය රු. 9,534,898 ක් දක්වා අඩුවී තිබුණි.

පෙර වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ විද්‍යායතනයේ ඌනතාවය රු. 4,051,233 කින් අඩු වීමට පුනරාවර්තන වියදම් සඳහා වූ රජයේ ප්‍රදානය රු.16,500,892 කින් හා පොලී ආදායම රු.4,288,639 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අධ්‍යයන කාර්ය සාධනය

විද්‍යායතනයේ ආයුර්වේද වෛද්‍යවේදී හා ශෛල්‍යවේදී පස් අවුරුදු උපාධි පාඨමාලාව පමණක් පවත්වා තිබුණු අතර, පසුගිය වර්ෂ දහයක කාලය තුල ලියාපදිංචි වී සිටි ශිෂ්‍යයින් 394 කින් ශිෂ්‍යයන් 38 දෙනෙකු

පාඨමාලා අතහැරගොස් තිබුණි. ශිෂ්‍යයන් 265 දෙනෙකු වර්ෂ අවසාන විභාගවලට පෙනී සිට ඇති අතර ඉන් සිසුන් 219 ක් සමත් වී තිබුණි.

මේ අනුව 2001/2002 අධ්‍යයන වර්ෂයේ සිට 2009/2010 අධ්‍යයන වර්ෂය දක්වා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 41 ත් සියයට 02 ත් අතර පරාසයක සිසුන් පාඨමාලා අතහැරගොස් තිබුණු අතර 2010/2011 අධ්‍යයන වර්ෂයට එය සියයට10 ක් වී තිබුණි.

3.2 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

<u>ගාස්තු අයකර පවත්වනු ලබන පාඨමාලා</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත කර නොගත් නිර්ණායකයක් පදනම් කරගෙන ගෙවීම් කිරීමට අමතරව නිර්ණායකය තුළ සඳහන් ව නොමැති දීමනාවක් වූ මසකට රු.1,000 බැගින් වූ සන්නිවේදන දීමනා ඇතැම් පාඨමාලා සමායෝජකවරු වෙත ගෙවා තිබුණි. 2012 වර්ෂය සඳහා එසේ ගෙවා තිබූ මුදල රු.30,000 ක් වී තිබුණි.

(ආ) විද්‍යායතනය විසින් සකස් කර ඇති නිර්ණායකයේ 6.7 වගන්තිය අනුව පාඨමාලාවන් සංවිධානය කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයට ගෙවීම් කිරීමේ දී රජයේ නිවාඩු දින කරනු ලබන සේවා වෙනුවෙන් දිනකට රු.5,000 ක උපරිමයකට යටත්ව පැමිණෙන දිනකට ගෙවිය හැකි වුවත් , රු.3,000 ත් රු.5,000 ත් අතර පරාසයක දිනකට පාඨමාලා 04 කින් ගෙවීම්කර තිබුණි. ඒ අනුව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අභ්‍යන්තර කමිටුවක් විසින් සකස් කරන ලද නිර්ණායකයට ද පටහැනිව රු.281,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.3 <u>ආර්ථික නොවූ ගනුදෙනු</u>

2010 සැප්තැම්බර් 28 දින ආයතනය විසින් රැහැන් රහිත සෘජු හා අභ්‍යන්තර දුරකථන පද්ධතියක් ටෙලිකොම් ආයතනයෙන් මිලදී ගැනීම සඳහා රු.277,140 ක් ගෙවීම් කර තිබුණු අතර පද්ධතියේ තිබූ දුර්වලතා හේතුවෙන් යහපත් සන්නිවේදනයක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. එහෙයින් නොමිලේ PABX පද්ධතියක් සැපයීමට ටෙලිකොම් ආයතනය එකඟ වුවත් ලබා දී තිබුණු දුරකථන නැවත ලබා නොදීම නිසා මාසික බදු මුදල හා බිල් පත් වල වටිනාකම රු.176,805 ක් නොගෙවීම හේතුවෙන් PABX පද්ධතිය ලබා දී නොතිබුණ.

3.4 <u>හඳුනා ගන්නා ලද පාඩු</u>

<u>භාර නොදුන් පුස්තකාල පොත්</u>

2012 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්ය මණ්ඩලය හා සිසුන් 74 දෙනෙකු ගෙන ගොස් 2013 ජුනි 28 දින තෙක් ආපසු භාරනොදුන් රු.30,090 ක් වටිනා පුස්තකාල පොත් 127 ක් වූ අතර අයකරගත යුතු මුදල රු. 113,526 ක් විය.මෙම පොත් හෝ මුදල් නැවත ලබාගැනීම හෝ පුස්තකාල තැනපතු වලින් අයකර ගැනීම සම්බන්ධයෙන් ඵලදායි ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

## 3.5 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වතුපිටිවල පිහිටි අක්. 05, රූඩ්. 03,පර්. 21. 32 ක ඖෂධ උද්‍යානය ආයතනය විසින් පරිහරණයට ගනු ලැබුවද , එහි නිරවුල් අයිතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) 2002 අගෝස්තු 21 දින ඉඩම් අමාත්‍යාංශයෙන් රු.9,263,000 ක් ගෙවා ලබාගත් පර්චස් 205.42 ක් වූ ඉඩමක් 2011 දෙසැම්බර් 31 දිනට රු.1,540,651 ක් ලෙස අඩු වටිනාකමට තක්සේරු කර ගිණුම් ගතකර තිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දින වන විටත් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් ඉඩම් අංක 04 ක යටතේ වූ එකතුව පර්චස් 419.2 ක ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබු අතර ,හිමිකම් ඔප්පු ද ආයතනය සතුව නොතිබුණි. එම ඉඩම්වල අයිතිය නිරවුල් කර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සඳහා ක්‍රියාකර නොතිබුණි.

(ඈ) නිකුත් කළ වැඩ අධිකාරී වාර්තාව අනුව ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් ඉඩමක් විද්‍යායතනය සතුව නැති බව සහතික කර තිබුණි. මේ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් කර සුදුසු ක්‍රියාමාර්ග 2013 ජුනි 28 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) ඉඩම් අංක 03 ක් යටතේ ස්ථාවර වත්කම් ලේඛනය අනුව ඉඩම්වල ප්‍රමාණයේ එකතුව පර්චස් 967.04 ක් වුවත් වැඩ අධිකාරී වාර්තාව අනුව එහි එකතුව පර්චස් 1967.41 ක් වීමෙන් පර්චස් 1000.37 ක වෙනසක් විය. එසේම ස්ථාවර වත්කම් ලේඛනයේ පර්චස් 143.02 ක ඉඩමක් වැඩ අධිකාරී වාර්තාව අනුව පර්චස් 107.76 ක් වූයෙන් පර්චස් 35.26 ක වෙනසක් විය.

## 3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

විගණනය සඳහා ඉදිරිපත් කළ අනුමත කාර්ය මණ්ඩල වාර්තාව හා දැනට විද්‍යායතනයේ තථ්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේ දී පහත පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| <u>අනධ්‍යයන</u> | | | |
| ලිපිකාර හා ආශ්‍රිත | 20 | 15 | 05 |
| කණිෂ්ඨ | 17 | 08 | 09 |
| <u>අධ්‍යයන</u> | | | |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ii | 27 | 20 | 07 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I | 06 | 03 | 03 |
| කථිකාචාර්ය (ආධුනික ) | 04 | 03 | 01 |
| | 74 | 49 | 25 |

මූලික සිද්ධාන්ත අංශය හා චිකිත්සා යන අංශ දෙකෙහි පමණක් අධ්‍යයන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 13 ක් නිරීක්ෂණය විය.

### 3.7 <u>සේවක පාර්තෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම</u>

සේවක පාර්තෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් රු.37, 599,840 ක අරමුදලක් ගොඩනැගීමට කටයුතු කර නොතිබුණි.

## 4. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

### 4.1 <u>ක්‍රියාකාර් සැලැස්ම - 2012</u>

විද්‍යායතනයේ 2012 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාර් සැලැස්මට අනුව වර්ෂය තුළ ඉටු කළ යුතු ප්‍රධාන ක්‍රියාකාරකම් 68 ක් විය. මෙම කාර්යයන් ලඟාකර ගැනීම සම්බන්ධයෙන් පිළියෙල කරන ලද විද්‍යායතනයේ ප්‍රගති වාර්තාව අනුව විගණන පරීක්ෂණ වලදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ ) වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්වලින් වර්ෂය අවසන් වන විටත් ,ආරම්භ නොකළ ව්‍යාපෘති 18 ක් වූ අතර ,වර්ෂය අවසන් වන විට නිම කළ යුතුව තිබුණත් එසේ නිම කිරීමට අපොහොසත්ව ප්‍රමාද වී තිබුණු ක්‍රියාකාරකම් 23 ක් විය.

(ආ) ක්‍රියාකාර් සැලැස්මෙහි වූ අපේක්ෂිත ක්‍රියාකාරකම් 68 න් වර්ෂය තුළ සම්පූර්ණයෙන්ම නිමකළ ක්‍රියාකාරකම් 12 ක් පමණක් විය. ඒ අනුව අපේක්ෂිත ක්‍රියාකාරකම් ප්‍රමාණයෙන් වර්ෂය තුළ නිමකර ගැනීමට විද්‍යායතනයට හැකි වී තිබුණේ සියයට 18 ක් පමණි. මේ අනුව ක්‍රියාකාර්

සැලැස්මෙහි කාර්යයන් සියයට 80 ට අධික ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂයේ දී ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

## 4.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් සැසඳීමේදී සියයට 10 සිට සියයට 145 දක්වා පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් වූයෙන් අයවැය ලේඛනය සඵල කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 4.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2010 සහ 2011 වර්ෂයන්හි වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභා ගත කර නොතිබුණි.

## 4.4 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

2008 වර්ෂයේදී ආයුර්වේද ශික්ෂණ රෝහල ආයුර්වේද දෙපාර්තමේන්තුවට පවරා තිබූ අතර , විද්‍යායතනය විසින් එම රෝහල වෙනුවෙන් ගෙවීම් කර තිබූ රු.1,989,577 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ප්‍රතිපූර්ණය කර ගෙන නොතබුණි. එම මුදල ලැබිය යුතු ජල ගාස්තු ලෙස ජංගම වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. පසුගිය විගණන වාර්තාවලින් හා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ද මේ පිළිබඳව අවධානය යොමු කර තිබුණද, 2013 ජුනි 28 දින තෙක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විද්‍යායතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඈ) වත්කම් පාලනය